මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		1,018,528	1,047,446
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
ආයෝජන වැඩිවීම/අඩුවීම		(549,148)	(421,119)
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		469,380	626,327
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		2,237,291	1,610,964
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**2,706,671**	**2,237,291**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය

	සමුච්චිත අරමුදල	මුළු වටිනාකම
ආරම්භක ශේෂය 01.01.2018	9,982,792	9,982,792
පෙර වර්ෂ ගැලපුම්	29,097	29,097
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය	1,111,045	1,111,045
	11,122,934	**11,122,934**
2018.12.31 දිනට ශේෂය	**11,122,934**	**11,122,934**

1. පොදු තොරතුරු

1.1 ලංකා ජර්මාණු කාර්මික අභ්‍යාස ආයතනය 2017 අංක 15 දරණ පනතින් පිහිටුවන ලද කාර්මික පුහුණු ආයතනයකි.

1.2 ගිණුම් කාල සීමාව

2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වන මාස 12 ක කාල පරිච්ඡේදයකි.

2. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත වලට අනුකූල ලෙස ආයතනයේ ගිණුම් ප්‍රකාශණ පිළියෙල කරන ලදි.

ගිණුම් ප්‍රකාශණ වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශණය,අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශණය, මුදල් ප්‍රවාහ ප්‍රකාශණය, ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් ඇතුලත්ය.

2.2 අඛණ්ඩ පැවැත්ම

ආයතනයට අඛණ්ඩ පැවැත්මක් ඇති බව සලකා ගිණුම් ප්‍රකාශණ පිළියෙල කර ඇත.

2.3 මිණුම් කිරීමේ පදනම

අදාල සටහන් වලින් විශේෂයෙන් හෙලිදරව් කර නොමැති අවස්ථා වලදී මූල්‍ය ප්‍රකාශණ උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම් කර පිළියෙල කර ඇත.

ඉඩම් හා ගොඩනැගිලි 2013 වසරේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණනය කර ඇත. එලෙසම වාහන 2014 වසරේදී ප්‍රත්‍යාගණනය කරන ලදි. 2014 වසරේදී රු.1,899,262.00 ක වටිනාකමට පුස්තකාල පොත් තක්සේරු කර ගිණුම්වලට ගැනීමට කටයුතු කරන ලදි.

2.4 ක්ෂය කිරීම

මිලදීගත් මස සිට ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලැබේ. ආයතනයේ වාර්ෂික ක්ෂය කිරීමේ අනුපාතයන් පහතින් සඳහන් කර ඇත.

	වාර්ෂික අනුපාතය
ගොඩනැගිලි	10%
මෝටර් රථ වාහන	25%
යන්ත්‍ර හා පුහුණු උපකරණ	12.5%
ලීබඩු උපකරණ	10%
කාර්යාල උපකරණ	25%
අනෙකුත් උපකරණ	25%
පුස්තකාල පොත්	25%

ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් හෝ ඊට අඩු කාලයක් පවතින වත්කම් ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. තොගය පෙර ලැබීම් පෙර නිකුතු ක්‍රමයට අගය කර ඇත.

2.5 විදේශ මුදල් ගණුදෙනු

විදේශ මුදලින් සිදු කරන ගණුදෙනු වලදී ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර ගිණුම් ප්‍රකාශවල පෙන්වනු ඇත.

2.6 ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන ගණුදෙනු

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලු ප්‍රමාණාත්මක ගණුදෙනු ගිණුම් ප්‍රකාශණ සඳහා අදාල කරගනු ලැබේ.

3. වගකීම් හා වෙන්කිරීම්

3.1 ගිණුම් ප්‍රකාශණ පිළියෙල කිරීමේදී හඳුනාගත් සියලු වගකීම් ගිණුම්ගත කර ඇත. එලෙසම විය හැකි වගකීම් සඳහා ප්‍රමාණාත්මක වෙන් කිරීමක් සිදු කර ඇත.

3.2 විශ්‍රාම පාරිතෝෂික

ගිණුම් ප්‍රකාශණ පිළියෙල කිරීමේදී 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව,විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම සිදු කරනු ලැබේ.එලෙසම ශ්‍රීලංගම ජනතාකරණය කරන අවස්ථාවේදී සේවයේ යෙදී සිටි (1990/12/28) සේවකයින් සඳහා 1994 අංක 21 දරණ ශ්‍රීලංගම පාලක මණ්ඩල පත්‍රිකා අංක 21 අනුව සේවය කල වසරකට අමතර සති 02 ක පාරිතෝෂික වෙන් කරනු ලැබේ.

3.3 විලම්භීත ආදායම්

භාණ්ඩාගාර ලැබෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන විලම්භීත ආදායම ලෙස ගිණුම්ගත කර ඇත. මෙම වටිනාකම වාර්ෂික ක්ෂය ප්‍රමාණය මත කපා හරිනු ලැබේ.

3.4 සේවක අර්ථ සාධක අයකිරීම්

සේවක අර්ථ සාධක අරමුදල සඳහා ආයතනයෙන් දායකත්වය 12% කි. සේවක දායක මුදල 08% කි. එලෙසම ශ්‍රීලංගම පත්වීම්ලාභී සේවක දායක මුදල 10% කි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } වීවීවයි/ඒ/සිපීවීවීඅයි/1/18/10 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2020 ජූනි 19 දින

සභාපති
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) වාර්ෂිකව ආයතනය විසින් මූල්‍ය කාර්යසාධන වාර්තාවේ දැක්වෙන ශුද්ධ මූල්‍ය අතිරික්තය හෝ ඌනතාවය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණත සමුච්චිත අතිරික්තය හෝ ඌනතාවය ලෙස වෙනම දැක්වීම වෙනුවට පරිවර්තන සංචිත (Translation Reserve) ලෙස අනුචිතව දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) (i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේදී සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර තිබූ පොලී ආදායම රු. 4,044,048 ක් මෙහෙයුම් ලාභයට ගැළපීම් කර නොතිබුණි.

(ii) නැවත ආයෝජනය කර තිබූ රු. 3,366,540ක්වූ පොලී ආදායම මුදල් ගලායාමක් ලෙස හා රු. 13,660,221ක්වූ කාලීන තැන්පතු ආපසු ගැනීම් මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනම දැක්වීම වෙනුවට ශුද්ධ අගය වූ රු. 10,293,681 ක් දක්වා තිබුණි.

(iii) එකතුව රු. 3,975,757ක්වූ කෙටිකාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පත් පොලී ආදායම මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබුණු අතර කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ රු. 68,291ක්වූ ලැබිය යුතු පොලී ආදායමේ වෙනස ගලපා නොතිබුණි.

(iv) වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු. 8,866,070 ක් වටිනා වත්කම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වත්කම් අත්පත් කරගැනීමක් ලෙස හා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් අනුචිත ලෙස දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු එකතු පිරිවැය රු. 41,437,189 ක් වූ දේපල පිරියත හා උපකරණ තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ සමුච්චිත අරමුදල් වශයෙන් රු. 844,877,725 ක් හා ප්‍රාග්ධන සංචිත වශයෙන් රු. 4,407,578 ක් දක්වා තිබූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 95 ඡේදය ප්‍රකාරව, එම සංචිතවල ස්වභාවය හා අරමුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9 හි 15 ඡේදයට අනුව තොග අගය කළ යුත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට වුවද ආයතනය විසින් තොග අගය කිරීමේදී පිරිවැය මත තොග අගය කර තිබුණි.

(ඊ) වටිනාකම රු. 734,130,951ක් වූ විධිමත් අනුමැතිය සහිත ප'නල් වවුචර් 238ක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම එකතුව රු. 14,470,197ක්වූ ණයගැති, ණයහිමි හා අමතර කොටස් තොගයට අදාල ශේෂ සනාථ කිරීම් හා තොග සත්‍යාපන

වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එවා නිවැරදි ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නිතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2017 අංක 15 දරන ලංකා පරමාණු කාර්මික අභ්‍යාස ආයතන පනත	
(i) 12(1) වගන්තිය	මණ්ඩලයේ රැස්වීම් ,යටත් පිරිසෙයින් මසකට එක් වරක්වත් පැවැත්විය යුතු අතර මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වන සනපූරණය පස් දෙනෙකු විය යුතුය . එසේ වුවද 2019 මැයි 31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් 07දෙනෙක් පත් කර තිබුණද 2019 ඔක්තෝබර් 20 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි .ආයතනය විසින් අවසාන වරට රැස්වීම් පවත්වා තිබුණේ 2018 සැප්තැම්බර් 28දින වූ අතර ,අදාල කාල සීමාව තුළ ගැනීමට නියමිතව ඇති වැදගත් කළමනාකරණ තීරණ ගැනීම අතපසු වී තිබුණි .තවද ඒ හේතුවෙන් 2019 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ එකඳු රැස්වීමක් හෝ පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ii) 17(5) වගන්තිය	අධ්‍යක්ෂ/විදුහල්පති ධූරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ස්ථිර පත්වීමක් සිදුකරන තෙක් අධ්‍යක්ෂ/ විදුහල්පති ධූරයේ කාර්යය ඉටුකිරීම සඳහා මණ්ඩලය විසින් මණ්ඩලයේ සාමාජිකයකු තෝරාපත් කරනු ලැබිය හැකි වුවත් 2019 මැයි 07 දින සිට විශ්‍රාම ගිය ආයතනයේ අධ්‍යක්ෂ/ විදුහල්පතිවරයා 2019 මැයි 29 දින සිට කොන්ත්‍රාත් පදනමින් නැවත බඳවාගෙන තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646	වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ආරම්භයේ සිටම ආයතනය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි.
(ඈ) 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	රාජ්‍ය ආයතන සතු අතිරික්ත මුදල් භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව ස්ථාවර තැන්පතු ,කාලීන තැන්පතු හෝ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය නොකළ යුතු වුවත් ,එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනය විසින් ස්ථාවර තැන්පතු ලෙස රු .24,836,310 ක් ද, භාණ්ඩාගාර බිල්පත් ලෙස රු .10,788,555 ක් ද ලෙස එකතුව රු .35,624,865 ක් ආයෝජනය කර තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතෙහි 4(ඌ) වගන්තිය	නියමිත ක්ෂේත්‍රවල තාක්ෂණ හා වෘත්තීය පුහුණු කිරීම් පවත්වාගෙන යාමේ සහ අධ්‍යාපනය ලබාදීමේ කාර්යය සඳහා කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම ආයතනයේ කර්තව්‍යයක් වුවද, ඒ අනුව

කටයුතු කිරීම සඳහා ආයතනය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතා කර නොමැති බව.

(අ) 2018 වර්ෂයේදී රු. 3,586,990 ක් වැයකර සේවා පරිගණකයක් හා නව පරිගණක ජාලය ස්ථාපිත කිරීමට අදාල අනෙකුත් උපකරණ ප්‍රසම්පාදනය කර තිබූ අතර, 2019 සැප්තැම්බර් වන විටද අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් සඳහා පරිගණක ජාල ස්ථාපිත කිරීමකින් තොරව අන්තර්ජාල පහසුකම් සපයාගැනීම පමණක් සිදුකර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 2.9.1 මාර්ගෝපදේශය සඳහා රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් 2017 මාර්තු 01 දින ඉදිරිපත් කරන ලද 32 වන අතිරේකය අනුව ප්‍රසම්පාදන කටයුතු වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ සහ ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කරනු ලැබීමේදී ප්‍රසම්පාදන රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් නිලධාරීන්ට කරනු ලබන ගෙවීම් අදාල කරනොගත යුතු අතර කිසිදු ගෙවීමක් නොකළ යුතුය. එයට පටහැනිව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ වූ ප්‍රසම්පාදනයන් 05 කට අදාලව කමිටු සාමාජිකයන්ට සහ අනෙකුත් නිලධාරීන්ට 2017 සහ 2018 වර්ෂයන් වෙනුවෙන් එකතුව රු. 35,250 ක් ගෙවා තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) ආයතනය විසින් මුදල් අයකිරීමේ පදනම මත 2018 වර්ෂයේදී පවත්වාගෙන යනු ලැබූ අර්ධ කාලීන පාඨමාලා 11 කින් ලැබූ රු. 3,292,300ක ආදායමට සාපේක්ෂව දේශන ගාස්තු, පුහුණු ද්‍රව්‍ය හා අනෙකුත් වියදම් සඳහා රු. 3,345,398ක් වැය කිරීම හේතුවෙන් එම පාඨමාලාවලින් රු. 162,098 ක පාඩුවක් සිදුවී තිබුණි. මේ පිළිබඳ විගණනය විසින් සිදුකළ විශ්ලේෂණය අනුව සන්ධ්‍යා කාලීන පාඨමාලා 08 ක් සම්බන්ධයෙන් පුහුණු අභ්‍යාසලාභීන් 04 සිට 10 දක්වා වූ කණ්ඩායම්වලට පාඨමාලා පවත්වා තිබූ අතර පාඨමාලාවන්ට අදාලව ලාභ සමවිඡේද ලක්ෂයන් හඳුනාගෙන කුඩා කණ්ඩායම් ඊළඟ කණ්ඩායම් හා ඒකාබද්ධ කිරීමට අවධානය යොමු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ 05 තුළ පූර්ණ කාලීන පාඨමාලා සඳහා මූලික සුදුසුකම් සපුරා තිබූ අයදුම්කරුවන්ගෙන් ඇතුළත් කර ගනු ලැබූ ප්‍රතිශතය සියයට 20 ත් සියයට 30 ත් අතර වූ අතර වාර්ෂිකව වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි ආයතනයේ ධාරිතාව වැඩි කර ගැනීම සඳහා නිසි සැලැස්මකින් යුතුව කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් අයදුම්කරුවන් 3,075 දෙනෙකුට පාඨමාලා හැදෑරීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා වක්‍රලේඛ අංක 30 ට අනුව, 2006 ජනවාරි 01 දිනට සිදුකර තිබූ වැටුප් පරිවර්තනයන්ට අදාලව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ 2008 සැප්තැම්බර් 29 දිනැති අංක DMS/C/1/PS/34 දරන ලිපියේ 2 ඡේදයේ සඳහන් උපදෙස්වලට පටහැනිව පෙර උපයා තිබූ වැටුප් වර්ධක නැවත ලබා දෙමින් 2008 ජූලි 01 දිනට සේවක මණ්ඩල අන්තර්ග්‍රහණය සිදු කර තිබූ බව නිලධාරීන් 32 දෙදෙනෙකුට අදාලව අභ්‍යන්තර විගණනය විසින් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය කර තිබුණි. එහිදී අන්තර්ග්‍රහණය කිරීමේදී වැටුප් වර්ධක 01 සිට 16 දක්වා වැඩියෙන් ලබාදී තිබීම හේතුවෙන් එම නිලධාරීන්ට 2016 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු. 1,504,100 ක් වැඩියෙන් ගෙවා තිබූ බවත් විගණනයට නිරීක්ෂණය විය. සාවද්‍ය ලෙස නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම නිවැරදි කිරීමට 2019 ඔක්තෝබර් 30 දින දක්වාම අපොහොසත්වී තිබුණි.

(ඈ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ උපදේශක දීමනා ගෙවීමේදී 2017 මාර්තු 23 දිනැති අංක 6/39/1/1 දරන නිපුණතා සංවර්ධන හා ව්‍යත්තිය පුහුණු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය සමග ඉදිරිපත් කරන ලද දීමනා සඳහා වන ආකෘති පත්‍රයේ සඳහන් නිර්ණායක 03 ක් සාවද්‍ය ලෙස අර්ථකථනය කොට ගෙවීම් සිදුකර තිබූ බව 2018 පෙබරවාරි සිට අප්‍රේල් මාසය දක්වා කාලපරිච්ඡේදයට අදාලව සිදුකරනු ලැබූ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 4.3 (අ) ඡේදය මගින් මේ පිළිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද අදාල නිවැරදි කිරීම් කරගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(ඉ) මාර්ග සංවර්ධන අධිකාරිය සතු ඉඩමක ආයතනය වෙනුවෙන් මහල් 06 කින් යුත් ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිකිරීමේ කටයුතු 2018 නොවැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණද 2019 සැප්තැම්බර් 30 දින වන විටත් අදාල ගොඩනැගිලි සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරවා ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද, මෙම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඊ) 2018 දෙසැම්බර් 31 දින වන විට ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 04 ක් ද ඇතුළුව තනතුරු 30 ක් පුරප්පාඩුව පැවති අතර 2020 ජුනි 10 දින වන විටද එම ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරුද ඇතුළුව තනතුරු 23 ක් පුරප්පාඩු වී පැවතුණි. ඒ අනුව, එම තත්ත්වය ආයතනයේ කටයුතු සාර්ථක ලෙස පවත්වාගෙන යාමට අහිතකර ලෙස බලපානු ලැබිය හැකි බව නිරීක්ෂණය විය.

(උ) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වන විට සිය සංවිධානයට අයත් සියළුම රටවල ආර්ථික සංවර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" හඳුන්වා දී ඇති අතර, එය සියළු

සාමාජික රටවල් විසින් ක්‍රියාත්මක කළ යුතු විශ්වීය ප්‍රකාශයක් වේ. ඒ අනුව, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විසින් මෙම න්‍යාය පත්‍රයට අනුකූලව තම ආයතනයට ගැළපෙන අරමුණු 04 ක් හඳුනාගෙන තිබුණද ඉන් අරමුණු තුනක් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ඉලක්ක හඳුනාගෙන නොතිබුණි.

(උ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය මගින් 2018 ජනවාරි 01 දින සිට 2019 ජුනි 30 දින දක්වා අභ්‍යන්තර විගණන විමසුම් 11 ක් කළමනාකරණය වෙත ඉදිරිපත් කර තිබුණද 2020 ජුනි 10 වන විට පිළිතුරු විගණන විමසුම් 04 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි.

(එ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2016 සහ 2017 වර්ෂයන්ට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තා 2019 ඔක්තෝබර් 24 දින වන විටද පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඒ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට රු. 657,330 ක වටිනාකම් වූ අඩමාණ ණය වෙන් කිරීමෙන් පසු එකතුව රු. 2,746,816 ක් වූ ණයගැති ශේෂයක් වූ අතර ඒ තුළ වර්ෂ 10 ට වඩා පැරණි ණයගැති ශේෂය රු. 428,205 ක් සහ වර්ෂ 5 ත් වර්ෂ 10 ත් අතර ණයගැති ශේෂය රු. 1,097,929 ක් වූ අතර එම ණය අයකර ගැනීම් කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

(ඔ) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් අමතර කොටස් නොගය තුළ එකතු වටිනාකම් රු. 432,252ක් වූ අයිතම 135කට අදාල ඒකක 11,594ක් වර්ෂ 3 සිට වර්ෂ 20කට අධික කාලයක් නිකුත් නොකර ගබඩාවේ පැවතුණි.

(ඕ) දිගු කාලයක සිට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පවත්වාගෙන යනු ලබන වටිනාකම් රු. 1,149,350,000ක් වූ ඉඩම් පවරා ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2018 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මතය ව්‍යාවනය</u>

1.2 <u>මතය ව්‍යාවනය සඳහා පදනම</u>

(අ) අ) 2019 වසර වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේදී,මෙම දෝෂය නිවැරදි කර ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර.01හි සඳහන් පරිදි සමුච්චිත අතිරික්තය /ඌනතාවය ලෙස දක්වා ඇත.

ආ) (i) 2019 වසර සිට වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේදී මෙම දෝෂය නිවැරදි කර තිබේ.

(ii) 2020 වසර සිට වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේදී මෙම දෝෂය නිවැරදි කර තිබේ.

(iii) 2020 වසර සිටමෙම දෝෂය නිවැරදි කරගිණුම් පිළියෙලකර තිබේ.

(iv) 2020 වසර සිටමෙම දෝෂය නිවැරදි කරගිණුම් පිළියෙලකර තිබේ.

(ඇ) ආයතනය සතු වත්කම් ප්‍රත්‍යාගනය කිරීම සඳහා කමිටුවක් පත්කර තිබේ.2020 සහ 2021 වසර වලදී රටතුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා ආයතනයේ සැලසුම් කල කාර්යයන් නිසි පරිදි සම්පූර්ණ කල නොහැකි විය. එලෙසම පුහුණු උපකරණ හා යන්ත්‍රෝපකරණ විශාල ප්‍රමාණයක් ආයතනය සතුව ඇති නිසා මෙම කාර්යය නිම කිරීම සඳහා වැඩි කාල සීමාවක් ගතවේ.ප්‍රත්‍යාගනය කාර්යය හැකි ඉක්මනින් සම්පූර්ණ කිරීමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත.එලෙසම මෙම කාර්යය නිම කර ගිණුම්වල ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි.

(ඈ) සංචිතවල ස්වභාවය හා අරමුණු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(ඉ) තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයට ගණනය කර නිවැරදි ලෙස 2020 වාර්ෂික ගිණුම් වලඉදිරිපත් කරන ලදි.

(ඊ) නිසි අනුමැතිය සහිත ජර්නල් වවුචර ලිපි ගොනු පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.</u>

1.4 <u>මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම</u>

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

නීතිරීති හා රෙගුලාසි වලට යොමුව අනුකූල නොවීම

(අ) 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනත

12(1) වගන්තිය 2019 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් නොකල බැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොමැත.

(ii)17(5) වගන්තිය අධ්‍යක්ෂ විදුහල්පති 2019.05.24 දින විශ්‍රාම ගත්අතරඅධ්‍යක්ෂ විදුහල්පති තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට පැවති දුෂ්කරතා සැලකිල්ලට ලක් කර 2019.06.28 දින පත්‍රිකා අංක 19/1926/115/057 අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 2019.05.27 දින සිට මාස 06 ක කාලයකට කොන්ත්‍රාත් පදනම මත පත් කරන ලදි.

2017අංක 15දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය පනතේ (1) 17හා (5) 17වගන්ති වලට අනුව අධ්‍යක්ෂ -විදුහල්පති ධුරයට ස්ථීර පත්වීමක් සිදු කරන තෙක් එහි කාර්ය ඉටු කිරීම සඳහා පාලන මණ්ඩල සාමාජිකයෙකු පත් කර ඇත.

(ආ) දැනට එක දිගට වසර ගණනක් භාවිත කල හැකි ලෙස සකස් කර ඇති පිටු 100කින් සමන්විත ධාවන සටහන් පොත)(PV 11) පිටපත් හෝ අවසන් වූ ධාවන සටහන් පොත් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඇ) ආයතනය ආරම්භයේ සිටම අද දක්වා ධාවන වාර්තාවේ (P 11) ඉන්ධන ලබා ගැනීම සටහන් කරන අතර ඉන්ධන ලබා ගන්නා සෑම අවස්ථාවකම ඉන්ධන ටැංකිය මුළුමනින්ම පුරවනු ලබයි.නමුත් මේ වන විට සේවක බස් රථ කිහිපයක ඉන්ධන පරීක්ෂාව සිදු කර ඇත. කොවිඩ් 19 තත්වය හේතුවෙන් තාවකාලිකව එම පරීක්ෂා කිරීම නතර වූ නමුත් දැනට එම පරීක්ෂාව සිදු කරමින් පවතී.

(ඈ) 2000ජුනි 27 දිනැති අංක
පී/එෆ/පීඊ/09 දරණ රාජ්‍ය
මුදල් චක්‍රලේඛය ආයතනය සතු ආයෝජන සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ගැනීම සඳහා ඉල්ලුම් කල නමුත් ඒ සඳහා පිළිතුරක් නොලැබුනි. මෙම ආයෝජන ආයතනයේ ඵලදායි කාර්යයන් සඳහා යොදවන ලෙසට පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාව විසින්ද උපදෙස් දී ඇත.එලෙසම අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ද මේ පිළිබඳ සාකච්ඡා කර තිබේ.

ඒ අනුව 2020/06/08 දිනැති පාලක මණ්ඩල පත්‍රිකා අංක 2020/04/01 යටතේ සේවක ණය යෝජනා ක්‍රමය සඳහා රු.මිලියන 10 ක් යෙදවීමටත්, 2020/06/29 දිනැති පාලක මණ්ඩල පත්‍රිකා අංක 2020/05/01 යටතේ බොරැල්ල ශාඛාව වැඩි දියුණු කිරීම, බොඩි පේන්ටින් හා පින්තාරු අංක ගොඩනැගිල්ලෙහි අඩුපාඩු සම්පූර්ණ කිරීම,අධ්‍යක්ෂ-විදුහල්පති නිල නිවස ප්‍රතිසංස්කරණය කිරීම,පංති කාමර වැඩි දියුණු කිරීම වැනි කාර්යයන් සඳහා අනුමැතිය ලබා ගෙන තිබේ. සැලසුම් කල කාර්යයන් වැඩි ප්‍රමාණයක් සිදුකර මේ වන විට ඉටුකර තිබේ.මෙම කාර්යයන් සඳහා ගෙවීම් කිරීමට අවශ්‍ය පරිදි ස්ථාවර තැන්පතු අවලංගුකර ප්‍රතිපාදන ලබා ගෙන ඇත.ඒ අනුව මෙම කාර්යයන් සඳහා රු.මිලියන 18.69 ක ස්ථාවර තැන්පතු භාවිතා කර තිබේ. ඉතිරි ආයෝජනයන්ද සුදුසු පරිදි මෙම කාර්යයන් සඳහා භාවිතා කිරීමට පියවර ගනු ලැබේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල ,කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල ,කර්තව්‍ය ,කාර්යයන්	නිරීක්ෂණ
	බොරැල්ල හා ආණමඩුව කලාපීය මධ්‍යස්ථානය ආරම්භ කර ත්‍රීරෝද රථ අළුත්වැඩියා පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි.
	ආණමඩුව කලාපීය මධ්‍යස්ථානය ආරම්භ කර එහි කෘෂි යන්ත්‍රෝපකරණ ශිල්පී පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි.

(අ) 2019 වර්ෂය අවසාන වන විට පරිගණක ජාලය ස්ථාපිත කර තිබූ අතර ඒ මගින් ආයතනයේ සේවක වැටුප් සැකසීම සඳහා වන මෘදුකාංග පැකේජයද ආයතනයේ ගිණුම් කටයුතු සඳහා වන ගිණුම්කරණ පද්ධතියද ස්ථාපිත කොට පවත්වාගෙන යමින් පවතී.

(ආ) වෙළඳපොල මිල සැදහුම් ක්‍රමයට අනුව සිදුකල ප්‍රසම්පාදන කාර්යයන් සඳහා නිලධාරින්ට දීමනා ලෙස ගෙවා තිබූ රු.35,250.00 ක මුදල නැවත අයකර ගන්නා ලදී.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට කාර්මික පාඨමාලා හැදෑරීමට හැකිවන අයුරින් ඉතාමත් අඩු පාඨමාලා ගාස්තු යටතේ අප ආයතනයේ කෙටිකාලීන පාඨමාලාවන් පවත්වාගෙන යනු ලබන අතර පාඨමාලා සඳහා වැයවන පිරිවැය ගණනය කර වැයවන වියදම ආවරනය කර ගැනීමට හැකිවන අයුරින් මෙම පාඨමාලා ගාස්තු තීරණය කර ඇත.තවද ආයතනයේ සන්ධ්‍යාකාලීන පාඨමාලා පවත්වාගෙන යනු ලබන්නේ පාසැල් අධ්‍යාපනය මග නතර කල හෝ විභාග අසමත් වූවන් ඉලක්ක කරගෙන ඔවුන්ගේ අවශ්‍යතාවය මත වේ.එබැවින් කුඩා කණ්ඩායමකට වුවද පාඨමාලා පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දෙන්නේ එම සිසුන්ගේ අනාගත සුභසිද්ධිය සඳහා වන අතර එවැනි කුඩා කණ්ඩායම් ඒකාබද්ධ කිරීමට යාමෙන් පාඨමාලාවල ප්‍රායෝගික කොටස් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වේ .අප ආයතනයේ පවත්වනු ලබන සියළුම පාඨමාලා සහනදායි මිල ගණන් යටතේ සේවයක් ලෙස පවත්වාගෙන යනු ලබන්නේ ලාභ ඉපයීමේ පරමාර්ථයෙන්ම නොව සිසුන් හට සහනදායිමිලකට ඉතා ඉහල ප්‍රමිතියකින් යුතු උසස් මට්ටමේ කාර්මික දැනුමක් ලබා දීමේ ප්‍රමුඛ අරමුණිනි.

M4 හා M5 පාඨමාලාවල එක් කණ්ඩායමක සිටිය යුතු අභ්‍යාසලාභීන් ප්‍රමාණය 6ක් වන අතර MO1,MO2 හා MO3 යන පාඨමාලා සඳහා එක් කණ්ඩායමක සිටිය යුතු අභ්‍යාසලාභීන් ප්‍රමාණය 04 කි. අනෙකුත් පාඨමාලා සඳහා එක් කණ්ඩායමක සිටිය යුතු අභ්‍යාසලාභීන් ප්‍රමාණය 08කි. මෙම සියළුම පාඨමාලා 80% ක් ප්‍රායෝගික කොටස් ආවරණය වන පරිදි සකස් කර ඇති බැවින් මෙහෙයවනු ලබන්නේ කුඩා කණ්ඩායම් වශයෙන් පමණි.පාඨමාලා සියල්ල ගත් කල සමස්ථ ආදායමෙන් පාඨමාලා සඳහා යන වියදම පියවා ගැනීමට හැකිවන අයුරින් මෙම පාඨමාලා මෙහෙයවනු ලබයි.

(ආ) වර්තමානයේ පාඨමාලා සඳහා ශිෂ්‍ය සහභාගිත්වය වෙනුවෙන් වැඩි ඉල්ලුමක් පැවතිය ද 2016වසරේ සිසුන් 600දක්වා වැඩිකරන විට ,සිසුන් 400ක් සඳහා පැවති ඉඩකඩ ඒ අයුරින් භාවිතයට ගැනීමට සිදු විය .සිසුන් ප්‍රමාණයට සාපේක්ෂව ඔවුන්ට සෛද්ධාන්තික හා ප්‍රායෝගික පුහුණුව ලබා දීමට පැවති ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පැනනැගී ගැටළු වලට විසදුම් ලෙස ප්‍රාථමික සී අංශය ලෙස නව ගොඩනැගිල්ලක් සැකසීමට අවශ්‍ය පියවර

ගන්නා ලදි. මීට අමතරව මෙම ආධුනිකයින් පළමු වසරේ සිට දෙවන හා තෙවන වසරවල් වලට අදාළ අංශ වෙත යාමේ දී ඒ ඒ අංශ තුල ද ඉඩ පහසුකම් වැඩි දියුණු කල යුතු වේ .ඒ අනුව දැනට යන්ත්‍රණ ,වෙල්ඩින් හා බල විදුලි අංශ තුල ඇති කොටස් දෙමහල් වන අයුරින් සකසා ඉඩ ලබා ගෙන ඇත .

මෙම වැඩිවන ඉල්ලුමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා නව වැඩහල් ,පන්තිකාමර හා පරීක්ෂණාගාර ඉදිකිරීමේ අරමුණින් ආයතනයට යාබද ,නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 4ක් පමණ වූ භූමි භාගය ආයතනයට පවරා ගැනීමට සැලසුම් කලද නෛතික බාධා හේතුවෙන් එම කාර්ය ප්‍රමාද වී ඇත.

(ඇ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30ට අනුව ,ආයතනයේ කාර්ය මණ්ඩලය නව වැටුප් ක්‍රමයන්ට අන්තර්ග්‍රහණය කර ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේදී වසර ගණනාවක් පුරා දැඩි සේවක විරෝධතා පැවතුනි .සේවක ගැටළු නිරවුල් කර ගැනීම උදෙසා ආයතනයේ පැවැති උපදේශක මණ්ඩලය රේඛීය අමාත්‍යාංශ ලේකම් ඇතුලු නිලධාරීන් ,ජාතික වැටුප් කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ අවස්ථා ගණනාවකදී සාකච්ඡා ගණනාවක් පවත්වමින් දැඩි ප්‍රයත්නයක් දරන ලදී .අන්තර්ග්‍රහණය ප්‍රමාද වීම තුළින් සේවක උසස්වීම් ලබා දිය නොහැකි වීම ,වැඩි වන වැටුප් පරිවර්තන ලබා දිය නොහැකිවීම ,කර්යක්ෂමතා විභාග පැවැත්විය නොහැකි වීම යනාදී ගැටළු නිර්මාණය වීමෙන් තවදුරටත් සේවක නොසන්සුන්තා වර්ධනය විය . අනතුරුව ආයතනයේ ක්‍රියාත්මක සියළු වෘත්තීය සමිති හා ඉහල කළමනාකාරිත්ව නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් ජාතික වැටුප් කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පැවැති සාකච්ඡා වලදී ලද උපදෙස් හා දැනුවත් කිරීම් වලට අනුව සේවක ජ්‍යෙෂ්ඨත්වයට බලපෑම් නොවන පරිදි උපයා ගෙන ඇති වැටුප් වර්ධක අනුව අන්තර්ග්‍රණය සිදු කරන ලදී .

මෙම ආයතනයේ කාර්ය මණ්ඩල සඳහා දේශීය මෙන්ම විදේශීය ශ්‍රම වෙළඳපොළ තුල පවතින ඉල්ලුම අනුව අඩු වැටුප් තලයන්වල ඔවුන් රඳවා ගැනීම දැඩි අභියෝගයක්ව පවතී .වැටුප් පරිවර්තන ක්‍රමවේදය සමාලෝචනයට ලක්කල අතිරේක ලේකම්තුමියද මේ සම්බන්ධව අවධාරණය කර ඇත .එසේම පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාවද දැනුම් දී ඇත්තේ රේඛීය අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ජාතික වැටුප් කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙම ආයතනයට ගැලපෙන විශේෂ වැටුප් ක්‍රමයක් අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසය .ඒ අනුව රේඛීය අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා ඉල්ලීමක් කර ඇත.

(ඈ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ උපදේශක දීමනා ගෙවීමේදී 2018 පෙබරවාරි මස සිට අප්‍රියෙල් මාසය දක්වා කාලයේදී සිදු වී ඇති අතපසුවීම් නිවැරදි කිරීමට කටයුතු කර ඇත .

(ඉ) ඉඩම් අයිතිය පැවරීමේ ක්‍රියාවලිය අමාත්‍යාංශ මට්ටමින් සිදු වන ක්‍රියාදාමයක් බැවින් ඒ අනුව කටයුතු කරමින් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් විසින් ගොඩනැගිලි අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ඉඩමේ නීත්‍යානුකූල අයිතිය දැක්වෙන ඔප්පුව අවශ්‍ය බැවින් ඉඩමේ අයිතිය කඩිනමින් ලං.ජ.කා.අ.ආයතනය වෙත පවරා දීමට කටයුතු කරන ලෙස 2016.10.31 දිනති අංක 4-1-/9/1-vi අංක දරන ලිපිය මගින් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. මේ වන විට ගොඩනැගිලි අනුමැතිය ලැබී ඇත.

නැවත අධ්‍යක්ෂ / විදුහල්පති විසින් එම ඉඩමේ අයිතිය නිරවුල් කර අප ආයතනය වෙත කඩිනමින් අයිතිය පවරා දීමට අවශ්‍ය කටයුතු සළසා දෙන ලෙස නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලං.ජ.කා.අ.ආ/DCE(W)/28/DP/2018 හා 2018.11.23 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් කර ඇත.

(ඊ) අධ්‍යක්ෂ -විදුහල්පති, නියෝජ්‍ය අධ්‍යක්ෂ -නියෝජ්‍ය විදුහල්පති, ප්‍රධාන ඉංජිනේරු - පුහුණු, ලේඛකාධිකාරී පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 04 යි

අධ්‍යක්ෂ -විදුහල්පති තනතුරට බඳවා ගැනීමට කිහිපවරක් අයදුම්පත් කැඳවුවද නියමිත සුදුසුකම් සහිත අයදුම්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් එම බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය .

අධ්‍යක්ෂ -විදුහල්පති තනතුරට ස්ථිර පත්වීමක් සිදු කරන තෙක් එම ධූරයේ කාර්යයන් ඉටු කිරීම සඳහා පාලන මණ්ඩලය විසින්, මණ්ඩලයේ සාමාජිකයකු 2020.02.18 දින පත් කර ඇත.

නියෝජ්‍ය අධ්‍යක්ෂ -නියෝජ්‍ය විදුහල්පති තනතුරෙහි රාජකාරී ආවරණය සඳහා ප්‍රධාන ඉංජිනේරු -නිෂ්පාදන සේවා හා නඩත්තු තනතුර දරන නිලධාරි මහතා පත් කර ඇත.

ලේඛකාධිකාරී තනතුරෙහි රාජකාරී ආවරණය සඳහා සහකාර ලේඛකාධිකාරී තනතුර දරන නිලධාරි මහතා පත් කර ඇත.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීමට පවතින ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පාලන සමඟ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු නිලධාරීන් හමුවී සාකච්ඡා කල අතර, 2021 ජුලි මසදී අතිරේක ලේකම් මානව සම්පත් විසින් කළම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් ද යොමු කර ඇත.

පුරප්පාඩුව පවතින අනෙකුත් තනතුරු වලින් තනතුරු 17 ක් සඳහා 2021.10.01දින සිට බඳවා ගැනීම් සිදු කර ඇත.

රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පාලනගේ අංක ADM/ 11-01/14හා 2021.12.2 දිනැති ලිපිය මඟින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අංක 13/304/1695/21 හා 2021.08.31 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදු කර තිබුණද මෙතෙක් පත් කිරීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තබන ලෙසට කල දැනුම් දීම පරිදි පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තබා ඇත.

(උ) අරමුණු 01 - ගුණාත්මක අධ්‍යාපනය

අප ආයතනය මඟින් පූර්ණ කාලීන පාඨමාලාවන් 11 ක් පවත්වනු ලබයි. ඒ සඳහා ආධුනිකයින් තෝරාගනු ලබන්නේ ඔවුන්ගේ රුචිකත්වය සහ පළමු වසර අවසානයේදී පවත්වනු ලබන විභාගයේදී ඔවුන් ලබාගන්නා ලකුණු පදනම් කරගෙනය. සතියේ දින 05 න් දින හතරක් ප්‍රායෝගික අභ්‍යාසයන්හි යෙදෙන අතර, ඉතිරි දිනය සෛධාන්තික පංති සඳහා යොදවනු ලැබේ. එය අනුපාතයක් ලෙස ප්‍රායෝගික 80% ක් වන අතර සෛධාන්තික 20% ලෙස දැක්විය හැකිය.

මෙම ප්‍රාථමික පුහුණු කාලයේදී ආධුනිකයින්හට සියලු වෘත්තීන් සඳහා අවශ්‍ය අධ්‍යාපනය කෙටි කාලීන අංශාන්තර පුහුණුව මඟින්ද කර්මාන්ත ශාලාවක ආරක්ෂිත උපකරණ සම්බන්ධයෙන්ද විධිමත් පුහුණුවක් ලබා දීමට කටයුතු කරනු ඇත.

ආධුනිකයින් කරන්නාවූ ප්‍රායෝගික අභ්‍යාස අලලා සතියකට වරක් එහි වාර්තාවක් (Weekly Report) ලිවිය යුතු අතර, ඇතැම් ප්‍රායෝගික කටයුතු සඳහා අදාල ව්‍යාපෘති වාර්තා (Project Report) පිළියෙල කිරීම ද අනිවාර්යය වේ.

ආචාර්ය මණ්ඩලය 99% ක්ම පාහේ මෙම ආයතනයෙන්ම අධ්‍යාපනය ලැබූ අය වීමත්, ඔවුන් සතු මනා ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම සිසුන්ගේ කුසලතා වර්ධනය සඳහා සෘජු දායකත්වයක් ලබාදේ. ආචාර්ය මණ්ඩලයේ තරුණ ගුරුවරුන් බොහෝ දෙනෙකු වැඩිදුර අධ්‍යාපනය සඳහා යොමුවී ඇති අතර, එය ආධුනිකයින්ගේ යහපතටද බෙහෙවින් ඉවහල් වේ. එයට අචාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙකු විදේශ ශිෂ්‍යත්ව, විදේශ රටවල රැකියාවල නිරතවීම සහ මෙරට ප්‍රමුඛපෙලේ ආයතන වල පුහුණුව ලැබීම ආදි වූ ක්‍රමයන්ගෙන් සිය දැනුම හා කුසලතා වර්ධනය කරගත් පිරිසක් බැවින් එහි ප්‍රතිලාභය ආධුනිකයින් වෙත ලැබෙන්නේ නිරායාසයෙනි. ආධුනිකයින්ගේ දැනුම උරගා බැලීම සඳහා වරින් වර විභාග පැවැත්වෙන අතර, එම කාලසීමාවන් අංශ මට්ටමින් තරමක් වෙනස් විය හැක. තවද කොවිඩ් වසංගතය හේතුවෙන් සිසුන් ආයතනයට කැඳවීමට නොහැකි වූ කා වකවානු තුලදී මාර්ගගත ක්‍රමය ඔස්සේ සිසුන්ට දැනුම ලබා දෙමින් ඔවුන්ව ආයතනය සමග සම්බන්ධව තබා ගැනීමට කටයුතු කරන ලදි. නවීන තාක්ෂණය ඔස්සේ දරුවන්ට ඉගැන්වීමේ කටයුතු කරගෙන යනු ලබයි.

තවද කාර්ය මණ්ලය හා පුහණුව අවසන් ආධුනිකයින් හට NVQ 5 පාඨමාලාවද ඉන් ඉදිරියට ඩිප්ලෝමා, උපාධි හා පශ්චාත් උපාධිය දක්වාද ඉගෙනීමේ කටයුතු සඳහා අවශ්‍ය කාලය සහ දැනුම ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක පවතී.

අරමුණ 02 - යහපත් ක්‍රියාකාරකම් සහ ආර්ථික වර්ධනය

අප ආයතනයේ පුහුණුව ලබන ආධුනික ආධුනිකාවන්ගේ දායකත්වය යටතේ සිදුකරනු ලබන සමාජ සුබසාධක වැඩ කටයුතු රාශියකි. අප ආයතනයට ආසන්න මොරටුව සොයිසාරාමයේ සිදුකරනු ලබන පිංකම් ආදිය සඳහා අවශ්‍ය සහභාගීත්වය මෙන්ම විහරස්ථානයේ සිදුකරන සුද්ද පවිත්‍ර කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය ලබාදීමද අප ආයතනය මඟින් සිදුකරනු ලැබේ.

වසරකට වරක් හෝ දෙවරක් රජයේ පෙරපාසලක (ලුනාව හෝ කලුබෝවිල) ඇඳන්, රෝද පුටු ආදී උපකරණ ගෙන්වා අලුත්වැඩියා කර දීමද අප විසින් සිදුකරනු ලබන සමාජ සත්කාරයකි.

එසේම, ඕස්ට්‍රේලියානු ආදි ශිෂ්‍ය සංගමයේ දායකත්වය ඇතිව ඉතා අඩු පහසුකම් සහිත ගම්මාන වල ජීවත්වන පවුල් සඳහා නිවාස හා රෝහල (කැදෑව රෝහල) ආදියද තනා පරිත්‍යාග කොට ඇත. එවැනි කටයුතු වලදී ශ්‍රම දායකත්වය ලාබදීම අප ආධුනිකයින් විසින් ඉතා කැපවීමකින් යුතුව කරනු ලබන්නකි. සුනාමි උවදුර වූ අවස්ථාවේදී හානි වූ නිවාස පිළිසකර කිරීමේ කටයුතු වලදී නිවෙස් වල විදුලි කටයුතු සහ ජලනල කටයුතු සාදා උපකාර කරන ලදී. තවද වෙනත් රජයේ සහ පෞද්ගලික ආයතන වල වාහන අප ආයතනය තුලින් අළුත්වැඩියා කර ගත හැක. එමඟින් ආධුනිකයින්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය වීම සිදුවන අතර ආයතනයට ආදායමක්ද හිමිවේ.

අරමුණු - 04 අඩුකල අසමානතාවය

සෑම වසරකම ආයතනය මඟින් පවත්වනු ලබන ආගමික ලබන ආගමික උත්සව කීපයකි. බෞද්ධ සැදැහැවතුන් වාර්ෂික පිරිත් පිංකමද, හින්දු බැතිමතුන් විසින් සිදුකරන සරස්වතී පූජා උත්සවයද , ඉස්ලාම් බැතිමතුන් විසින් රාමසාන් උත්සවයද වර්ෂය අවසානයේදී කතෝලික බැතිමතුන් විසින් නත්තල් උත්සවයද පවත්වනු ලැබේ. මේ සියලු ආගමික උත්සව සියලු ආගමික හෝ වාර්ගික භේදයකින් තොරව ආයතනයේ පොදු කටයුතු ලෙස සලකා සියලුදෙනා දායකත්වය සැපයීම හා සහභාගී වීමද විශේෂයෙන් සඳහන් කල යුතුය.

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිත්තකොට ගනිමින් අප්‍රේල් මස පවත්වනු ලබන අවුරුදු උත්සවයද සියලු දෙනා ඉතා සතුටින් සහභාගී වන සංස්කෘතික අංගයකි.

සෑම වර්ෂයකම පලමු හෝ දෙවන අධ්‍යයන වාර ඇතුලත අංශාන්තර ක්‍රිකට්, පාපන්දු, වොලිබෝල් තරඟ මාලාවක් පැවැත්වීමද ආධුනිකයින්ගේ ක්‍රීඩා කෞශල්‍යය, එකමුතුව සහ දරාගැනීමේ ශක්තිය වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් වේ. ඊට අමතරව වසර දෙකකට පමණ වතාවක් නිවාසාන්තර ක්‍රීඩා උළෙලක් පැවැත්වීමද ආයතනයේ ආධුනික ආධුනිකාවන් වෙනුවෙන් සිදුකරනු ලබන මහඟු කටයුත්තකි.

එසේම සෑම අංශයක්ම නියෝජනය වන පරිදි සතියකට එක් දිනක් උදැසන 07.30 – 09.00 අතර කාලය තුල ක්‍රීඩා කිරීම සඳහා සෑම ආධුනිකයෙකුටම අවසර ලබා දී ඇත. මේ සඳහා මැනවින් නඩත්තු කරනු ලබන ක්‍රීඩා පිටියක් මෙන්ම කාය වර්ධන මධ්‍යස්ථානයක්ද අප සතුව පවතී.

ආයතනය සතුව තූර්ය වාදක කණ්ඩායමක් මෙන්ම බටහිර සංගීත කණ්ඩායමක් තිබෙන බව සඳහන් කල යුතුය. එසේම ආයතනයේ අවශ්‍යතාවය පරිදි විටින්විට පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශන සහ ප්‍රසංග සඳහා ඒ සඳහා දක්ෂකම් ඇති ආධුනික ආධුනිකාවන්ට ගායන, වාදන, රංගන, නිවේදන ආදී විවිධ ඉසව් ඔස්සේ සිය දක්ෂකම් පෙන්වීමට අවස්ථාව උදාවේ. මේ කටයුතු සඳහා බාහිර සංගීත උපදේශකවරයෙකුගේද සහය ලබා ගන්නෙමු. මෙහිදී දරුවන්ගේ සමානතාවය සහ බැඳීම් වැඩිකෙරෙනු ඇත.

අරමුණු 05 -- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියළුම කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.

සපුරාගැනීම සඳහා ඉලක්කයන් .5a ජාතික නීති රීති වලට අනුකූලව කාන්තාවන්ට ආර්ථික සම්පත් සඳහා සමාන අවස්ථාව ලබා දීම.

ලං.ජ.කා.අ .ආයතනයේ පාඨමාලා සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයේම අධුනික ආධුනිකාවන් බඳවා ගැනීම සඳහා කටයුතු කලද , 2016 වසර වන විට කාන්තා ආධුනිකාවන් පාඨමාලා සඳහා යොමුවීම ඉතාම අවම මට්ටමක පැවතින).වසරකට දෙදෙනෙක් හෝ තිදෙනෙක් පමණ (එබැවින් කාන්තා ආධුනිකාවන් සඳහාද පුහුණුවීම් කාර්යයන් සඳහා සමාන අවස්ථා ලබා දීම සඳහා කාන්තා ආධුනිකාවන් වැඩි ප්‍රමාණයක්) බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉලක්ක කරන ලදි.

- ප්‍රචාරණ කටයුතු වලදි කාන්තා ආධුනිකාවන් වැඩි කිරීම සම්බන්ධව ප්‍රමුඛතාවයක් ලබා දීම.
- ආයතනයට ආධුනිකයින් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ වලදි ආධුනිකාවන්ට විශේෂ අවස්ථාවක් ලබා දීම.
- කාන්තා ආධුනිකාවන් සඳහා නව පඨමාලා ඇති කිරීම සඳහා සැලසුම් කිරීම.
- කාන්තා ආධුනිකාවන්ගේ පහසුකම් සඳහා රු මිලියන 13.00ක පමණ වියදමින් ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීම.

ප්‍රගතිය
2020 වසර සඳහා ඇතුලත්කර ගන්නා ලද කාන්තා අධුනිකාවන් සංඛ්‍යාව 25 කි

(උ) ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇති අතර,අභ්‍යන්තර විගණන විමසුම් සඳහා ප්‍රමාදයකින් තොරව පිළිතුරු ලබා දීමට අදාල නිලධාරින්ට උපදෙස් දී තිබේ.

(එ) 2016 හා 2017 වාර්ෂික වාර්තා පිළියෙල කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

(ඒ) ශ්‍රීලංගම ඩිපෝවල බස්රථ අළුත් වැඩියා කිරීම සඳහා ලැබියයුතු මුදල් ශේෂ වලින් ණයගැති ශේෂය සෑදී තිබේ. මෙම ආයතනය ශ්‍රීලංගම ආයතනය යටතේ පැවති කාල සීමාවේ සිට ලැබිය යුතු ණය ශේෂ වලින් මෙම වටිනාකම සෑදී තිබේ.අප විසින් අදාල ඩිපෝ වලට ණය අයකර ගැනීම සඳහා ලිපි නිකුත් කලද ඒ සඳහා පිළිතුරු නොලැබේ.එම ඩිපෝ වලද මෙම ණය ශේෂ පිළිබඳ තොරතුරු නොමැතිවීම ඊට හේතුවයි.මේ සම්බන්ධව

අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේද සාකච්ඡා කර ඇති අතර, ශ්‍රී ලංගම සමඟ සාකච්ඡා කර නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

(ඔ) අමතර කොටස් තොගයේ ඇති අනවශ්‍ය කොටස් හඳුනාගෙන ඒවා අපහරණය කිරීමට පියවර ගෙන තිබේ.ඒ අනුව ඉවත් කල යුතු අමතර කොටස් හඳුනාගෙන ඇති අතර,එම කොටස් අපහරණය තහවුරු කිරීමේ කමිටුව මගින් තහවුරු කර ඇත.මෙම කාර්යයහි ඉදිරි පියවර කෙටි කාලයක් තුලදී නිම කරනු ලැබේ.

(ක) දීර්ඝ කාලයක සිට ආයතනය භුක්ති විඳගෙන එනු ලබන ඉඩම් වල සහ ගොඩනැගිලි වල අයිතිය විධිමත් පරිදි ආයතනය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ඉල්ලීමක් අමාත්‍යාංශ ලේකම් වෙත 2019.05.09 දින (ඇමුණුම් 06)යොමු කර ඇති අතර ,ඒ අනුව ඉඩම්වල අයිතිය පවරා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා අමාත්‍යාංශ ලේකම් විසින් ඉඩම් කොමසාරිස් වෙත 2019.08.05 දින ලිපියක් යොමු කර ඇත.

මෙම ඉඩම් වල වර්තමාන භුක්තිය පිළිබඳ පරීක්ෂා කර බලා විස්තර වාර්තාවක් ලබා දෙන ලෙස ඉඩම් කොමසාරිස් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත 2020.02.17 දින යොමු කර ඇත. ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ඉඩම සම්බන්ධව ශ්‍රීලංකා ගමනාගමන මණ්ඩලයේ හිමිකම පිළිබඳ තොරතුරු හා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වෙත ලබා දී ඇත්තේ කෙසේද යන්න පිළිබඳව තොරතුරු ප්‍රාදේශිය ලේකම් වෙත දැනුම් දෙන ලෙස දන්වා, ලේකම් නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් හා මටද පිටපත් සහිතව ලිපියක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති වෙත 2020.02.18 දින යොමු කර ඇත.

මෙම ඉඩම ආයතනය වෙත පවරා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින බව දන්වමි.

උපාලි රණසිංහ
අධ්‍යක්ෂ-විදුහල්පති
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය